# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි තෙවන පරීක්ෂණය (බාහිර) - 2023
2026 ජනවාරි / පෙබරවාරි

මානවශාස්ත්‍ර පීඨය

## ප්‍රතිබිම්බ කලා
(නව නිර්දේශය)

ප්‍රතිබිම්බ කලා ඇගයීම IMAT – 38214

ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි. කාලය : පැය 03 යි.

---

1. "ශිල්පයක් හා කලාවක් ලෙස ඡායාරූපකරණය බිහිවී වසර දෙසීයක් සම්පූර්ණ වී ඇත." එම ඓතිහාසික ගමන් මගෙහි සුවිශේෂ සන්ධිස්ථානයන් කෙරෙහි අවධානය යොමු කර, ඡායාරූප සඟරාවකට සුදුසු ලිපියක් සම්පාදනය කරන්න.

2. සංරචනය (Composition) යනු කුමක්දැයි හඳුන්වා, එය ඡායාරූපකරණයට විශේෂිතව නිදර්ශන සහිතව විමසන්න.

3. අධියථාර්ථවාදී සංකල්පය (Surrealism) අනෙකුත් කලා මාධ්‍ය අතර ප්‍රචලිත වීමට හා නිර්මාණයට බඳුන්වීමට චිත්‍ර කලාව විසින් සිදුකළ බලපෑම් උදාහරණ සහිතව සාකච්ඡා කරන්න.

4. අධිගතිකපරාස (High Dynamic Range) ඡායාරූපකරණයේ ආරම්භය හා විකාශනය පැහැදිලි කර, ඡායාරූපකරණයේදී ඒවා භාවිතයේ වැදගත්කම විමසන්න.

5. ඔබ පාසල් ඡායාරූප සංගමයක සාමාජිකයෙකු යැයි උපකල්පනය කර, අන්තර් පාසල් ඡායාරූප තරගයක් සංවිධානය කිරීම සඳහා නිර්මාණ කැඳවීමට සුදුසු තොරතුරු පත්‍රිකාවක් සම්පාදනය කරන්න. එම ඡායාරූප තරගය සඳහා සුදුසු නමක් ද යෝජනා කරන්න.

6. පික්සල් (Pixel) යනු කුමක්දැයි හඳුන්වා ඩිජිටල් ඡායාරූපයක් නිර්මාණය කිරීමේදී විභේදනය (Resolution) වැදගත් වන ආකාරය විස්තර කරන්න.

7. ඡායාරූපකරණයට අදාළ ජාතික හෝ ජාත්‍යන්තර සංවිධානයක් නම් කර ඒ පිළිබඳ විස්තර කරන්න.

8. "සිනමාව ජීවිතාදර්ශ සපයන ප්‍රබල කලා මාධ්‍යයකි." මෑතකදී ඔබ නැරඹූ සිනමා නිර්මාණයක් පදනම් කොට ඒ පිළිබඳ රසාස්වාදයක යෙදෙන්න.

9. පහත සඳහන් මාතෘකා අතරින් දෙකක් (02) තෝරා කෙටි සටහන් ලියන්න.
   i. වියුක්ත සංකල්පය / Abstract concept
   ii. Lightroom
   iii. අභිසංකලනය / Manipulation
   iv. මංගල ඡායාරූපකරණය
   v. ගෘහ නිර්මාණ ඡායාරූපකරණය / Architectural photography
   vi. නැවතුම් චලිතය (Stop motion)